# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 21 දරන
# ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පනත

---

[සහතිකය සටහන් කළේ 1985 ජූනි මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1985 ජූනි මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල රු. 17.75 තැපැල් ගාස්තුව : රු. 4.60 යි.

# 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පනත

[සහතිකය සටහන් කළේ 1985 ජූනි මස 07 වන දින.]

එල්. ඩී.—ඕ. 4/84.

**ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, එහි බලතල හා කාර්ය විධිමත් කිරීම පිණිස ද, 1980 අංක 32 දරන විදේශ සේවානියුක්ති නියෝජිත යන්‍ය පනත ඉවත් කිරීම පිණිස ද, ඊට හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. **ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.**

2. පෞද්ගලික අංශයේ ව්‍යවසායක් විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය. **මේ පනත අදාළ වීම.**

## I වන කොටස

## ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පිහිටුවීම

3. (1) (මෙහි මින් මතු "කාර්යාංශය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය යනුවෙන් හඳුන්වනු ලබන කාර්යාංශයක් පිහිටුවනු ලැබිය යුතු ය. **ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පිහිටුවීම.**

(2) කාර්යාංශය (1) වන උපවගන්තියෙහි ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, ඊට අඛණ්ඩ පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද ඒ නාමයෙන් කාර්යාංශය විසින් නඩු පැවරීම සහ ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

4. කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ කාර්යාංශයේ සාමාජිකයන් විය යුතු ය. **කාර්යාංශයේ සාමාජිකයෝ.**

5. (1) කාර්යාංශයේ (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විය යුතු අතර එය පහත දැක්වෙන සාමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය:— **අධ්‍යක්ෂ මණ්ඩලය.**

(අ) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අදහස් විමසා අමාත්‍යවරයා විසින් පත් කරන ලද එක් සාමාජිකයෙක්;

(ආ) විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විසින් පත් කරන ලද එක් සාමාජිකයෙක් ;

(ඇ) [illegible] කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විසින් පත් කරන ලද එක් සාමාජිකයෙක් ;

(ඈ) අමාත්‍යවරයා විසින් පත් කරන ලද වෙනත් සාමාජිකයන් අට දෙනෙක් ; ඔවුන් අතුරින් සතර දෙනකු මේ පනත යටතේ බලපත්‍ර ලත් විදේශ සේවා නියුක්ති නියෝජිතායතනවල නියෝජිතයන් විය යුතු ය.

(2) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වෙතොත් ඔහු අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එලෙස කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

(3) නාම අධ්‍යක්ෂවරයකු ම, ඔහු කලින් ඉල්ලා අස්වුවහොත්, මියගිය හොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අවුරුදු දෙකක කාලයක් ධුරය දැරිය යුතු ය.

(4) අමාත්‍යවරයා වෙත යොමු කරන ලද ලිපියක් මඟින් අධ්‍යක්ෂ වරයකුට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) ඉල්ලා අස්වීමෙන් හෝ සිය ධුර කාලය ඉකුත්වීමෙන් හෝ සිය ධුරය හිස් කරන අධ්‍යක්ෂවරයෙක් නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(6) (අ) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා යම් අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ආ) ධුරයෙන් ඉවත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයකු, අධ්‍යක්ෂ වරයකු වශයෙන් හෝ වෙනත් යම් තත්ත්වයකින් කාර්යාංශයෙහි සේවය කිරීම හෝ නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු නොවිය යුතු ය.

(7) (අ) සිය ධුර කාලය ඉකුත්වීමෙන් තොරව අන්‍යාකාරයකින් අධ්‍යක්ෂවරයකු සිය ධුරය හිස් කළහොත්, අමාත්‍ය වරයා විසින්, (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ල ඇතිව, එසේ ධුරය හිස් කරන අධ්‍යක්ෂවරයා වෙනුවට අධ්‍යක්ෂවරයකු වීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ පත් කරන ලද යම් අධ්‍යක්ෂවරයකු සිය ධුරය කලින් හිස් කළහොත් මිස ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(8) රෝගාතුරවීමේ හෝ වෙනත් අබලතාවක හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන් සිය ධුරයේ කාර්ය ඉටු කිරීමට අධ්‍යක්ෂවරයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක ඒ නොහැකියාවේ හෝ බැහැරව සිටීමේ කාලය තුළ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට සුදුසු තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

6. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලබන ආකාරය සහ අනුප්‍රමාණ අනුව කාර්යාංශයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය. කාර්යාංශයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.

7. කාර්යාංශය විසින් ඇති කරන ලද හෝ ඇති කිරීමට යෝජිත යම් ගිවිසුමක් පිළිබඳව කෙලින් ම හෝ අනියම් ලෙස යම් සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයකු විසින් ඔහුගේ සම්බන්ධතාවේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමක දී හෙළි කළ යුතු ය. ඒ හෙළි කිරීම මණ්ඩලයේ වාර්තාවෙහි වාර්තා කරනු ලැබිය යුතු අතර ඒ අධ්‍යක්ෂවරයා, ඒ ගිවිසුම සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගි නොවිය යුතු ය: කාර්යාංශය ඇති කිරීමට යන ගිවිසුම් පිළිබඳ සම්බන්ධතා කාර්යාංශයේ සාමාජිකයන් හෙළි කළ යුතු බව.

එසේ වුවද, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක නිලධරයකු වශයෙන් හෝ රාජ්‍ය සංස්ථාවක අධ්‍යක්ෂවරයකු වශයෙන් ගිවිසුමක් පිළිබඳව කාර්යාංශයේ යම් අධ්‍යක්ෂවරයකුට තිබිය හැකි සම්බන්ධතාව මේ වගන්තියේ අර්ථානුකූලව සම්බන්ධතාවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

8. මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සඳහා සාමාජිකයන් පස් දෙනකු සිටිය යුතු ය. මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්, මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ ස්වකීය කාර්ය පරිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ රැස්වීම්වල ගණපූරණය සහ කාර්ය පරිපාටිය විධිමත් කිරීම.

9. මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන් අතර යම් පුරප්පාඩුවක් හෝ යම් අධ්‍යක්ෂවරයකුගේ පත්වීම පිළිබඳ වූ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම, මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය. මණ්ඩලයේ ක්‍රියාවල හෝ කටයුතුවල වලංගු භාවය.

10. මණ්ඩලය විසින් කාර්යාංශයේ කටයුතු පරිපාලනය කළ යුතු අතර, ඒ කාර්යය සඳහා කාර්යාංශයේ සියලු බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ සාමාජිකයන් විසින් කාර්යාංශයේ කටයුතු පරිපාලනය කළ යුතු බව.

11. (1) කාර්යාංශයේ කටයුතු කාර්යක්ෂම ව පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය ස්වකීය බලතල සහ කාර්ය කිසිවක් මණ්ඩලය විසින් සභාපතිවරයාට, අධ්‍යක්ෂවරයකුට හෝ කාර්යාංශයේ සේවානියුක්තයකුට හෝ පවරා දෙනු ලැබිය හැකි ය. මණ්ඩලයේ බලතල සහ කාර්ය පැවරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලයක් හෝ කාර්යයක් පවරා දෙනු ලැබූ සෑම තැනැත්තකු විසින් ම, මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් ව, ඒ බලය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

12. (1) අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයන් අතුරින් මණ්ඩලයේ සභාපතිවරයා පත් කරනු ලැබිය යුතු ය.

(2) රෝගාතුරවීමෙන් හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් හෝ තම ධුරයේ කාර්ය ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයාට තාවකාලිකව නොහැකි වුවහොත් ඔහු වෙනුවට ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ සියලු රැස්වීම්වල දී සභාපතිවරයා මූලාසනය ගැනිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමක දී සභාපතිවරයා පැමිණ නොසිටිය හොත්, පැමිණ සිටින අධ්‍යක්ෂවරයන් විසින්, ඒ රැස්වීමේ මූලාසනය දැරීමට තමන් අතුරින් එක් අධ්‍යක්ෂවරයකු තෝරා පත් කර ගත යුතු ය.

(4) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා වෙත යොමු කරන ලද ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) අමාත්‍යවරයා විසින්, හේතුවක් නොදක්වා, සභාපතිවරයාගේ පත්වීම අවලංගු කරනු ලැබිය හැකි ය.

(6) (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ ධුර කාලය විය යුතු ය.

(7) මණ්ඩලයේ යම් රැස්වීමක සභාපතිවරයාට තමාගේම ඡන්දයට අතිරේක ව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

කාර්යාංශයේ මුද්‍රාව.

13. (1) කාර්යාංශයේ මුද්‍රාව මණ්ඩලයේ භාරයේ හෝ මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ කාර්යාංශයේ යම් නිලධරයකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකින් කාර්යාංශයේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂවරයන් දෙදෙනකු ඉදිරිපිට හෝ අධ්‍යක්ෂවරයන් දෙදෙනකුට පැමිණ සිටිය නොහැකි අවස්ථාවක එක් අධ්‍යක්ෂවරයකු සහ මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයකු ඉදිරිපිට හැර, කාර්යාංශයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නො තැබිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, ඒ අධ්‍යක්ෂවරයන් සහ නිලධරයා විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතුය.

කාර්යාංශය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල.

14. (1) කාර්යාංශයේ කාර්ය ඉටුකිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් කාර්යාංශයට ලිඛිත විධාන දෙනු ලැබිය හැකි අතර කාර්යාංශය විසින් ඒ විධාන ක්‍රියාවේ යෙදිය යුතු ය.

(2) කාර්යාංශයේ දේපළ සහ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් [illegible] වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ආකාරයක් අනුව තමාට සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලයට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ හැම විධානයක් ම ක්‍රියාවේ යෙදිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් යොමු කරනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් කාර්යාංශයේ සියලු කටයුතු හෝ ඉන් කිසිවක් හෝ විමර්ශනය කොට වාර්තා කිරීමට අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර එබඳු නියමයක් කරනු ලැබූ විට කාර්යාංශය විසින් ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට නියමය ක්‍රියාවේ යෙදීමට අවශ්‍ය සියලු පහසුකම් සැලසිය යුතු අතර සියලු තොරතුරු සැපයිය යුතු ය.

15. (අ) ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්ති අවස්ථා සොයා ලීම සහ සංවර්ධනය කිරීම; කාර්යාංශයේ කාර්යයන්.

(ආ) විදේශ සේවානියුක්ති නියෝජිතායතනවලට ඒවායේ වැඩීම සහ සංවර්ධනය සම්බන්ධයෙන් සහාය දීම සහ ආධාර කිරීම;

(ඇ) ශ්‍රී ලංකාවේ ඇති දක්ෂතා සඳහා විදේශ වෙළෙඳපොළවල් වර්ධනය කිරීමට පියවර ගැනීම;

(ඈ) විදේශීය නියෝජිතායතන සමග සේවානියුක්තිය පිළිබඳ නියමයන් සහ කොන්දේසි සාකච්ඡා කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභීන්ට සහාය දීම;

(ඉ) විදේශ සේවා නියුක්ති නියෝජිතායතනවල ව්‍යාපාර කටයුතු විධිමත් කිරීම සහ ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීම;

(ඊ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගැනීමේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා විදේශ සේවානියුක්ති නියෝජිතායතනවලට බලපත්‍ර නිකුත් කිරීම සහ ඒ බලපත්‍රවල නියමයන් සහ කොන්දේසි නිර්ණය කිරීම;

(උ) සේවානියුක්ති ගිවිසුම් සඳහා ප්‍රමිති ඇති කිරීම සහ සේවානියුක්ති ගිවිසුම් සකස් කිරීම;

(ඌ) බඳවා ගැනීමේ ගිවිසුම් පිරිමත් කිරීම පිණිස අදාළ විදේශික බලධරයන්, සේවායෝජකයන් සහ සේවා නියුක්ති නියෝජිතායතන සමග ගිවිසුම්වලට ඇතුළු වීම;

(එ) සාධාරණ වේතන සහ සේවා නියුක්ති තත්ත්වයන් සහතික කෙරෙන සේවා නියුක්තිය පිළිබඳ ආදර්ශ ගිවිසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඒ) සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලැබ එතෙර යන ශ්‍රී ලාංකිකයන්ට නිකුත් කරන ලද ලේඛනවල නිරවද්‍යතාව පරීක්ෂා කිරීම;

(ඔ) ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත වූ සේවා නියුක්ති අවස්ථා පිළිබඳ පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු කිරීම;

(ඕ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයන් පිටවීම සහ ඒ සේවා නියුක්තියෙන් පසු ඔවුන් පෙරළා පැමිණීම සමීක්ෂණය කිරීම සඳහා තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(ක) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධනය සහ ආරක්ෂාව භාරගැනීම;

(ඛ) කම්කරු සුභසාධන අරමුදලක් පිහිටුවීම;

(ග) සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලැබ, එතෙර යන ශ්‍රී ලාංකිකයන් පුහුණු කිරීම සහ හුරු කිරීම මලපසු ලැබීන්ගේ සහභාගිත්වය ඇතිව භාර ගැනීම;

(ඝ) සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලැබ එතෙර යන ශ්‍රී ලාංකිකයන්ට ආධාර දීම;

(ච) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයේ නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගෙන් පරිත්‍යාග සහ දායක මුදල් භාර ගැනීම සහ ඒ ශ්‍රී ලාංකිකයන්ගේ පවුල් පුනරුත්ථාපනය කිරීම, ඒ පවුල්වලට මග පෙන්වීම සහ උපදෙස් දීම සහ තොරතුරු සහ ආධාර සැලසීම සඳහා, ඒ පරිත්‍යාග සහ දායක මුදල් ප්‍රයෝජනයට ගැනීම;

(ඡ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයේ නියුක්ත ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් ආයෝජන කටයුතු භාර ගැනීම;

(ජ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තියෙන් පසුව ශ්‍රී ලංකාවට ආපසු පැමිණෙන ශ්‍රී ලාංකිකයන්ගේ පුනරුත්ථාපනය සඳහා වැඩ සටහන් භාර ගැනීම

කාර්යාංශයේ පරමාර්ථ වන්නේ ය.

කාර්යාංශයේ බලතල

**16.** (1) කාර්යාංශයේ පරමාර්ථ ක්‍රියාවට යෙදීමට අවශ්‍ය හෝ හිතකර යැයි පෙනෙන්නේ වූ ද ආනුෂංගික යම් දෙයක් කිරීමට කාර්යාංශයට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පිරිනමා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව—

(අ) කාර්යාංශයට අයත් මුදල්වලින් මේ පනතේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන යම් මුදල් ප්‍රමාණයක්, සුදුසු යයි මණ්ඩලය සලකන කොටස්, සුරැකුම්පත් හෝ තැන්පතු විෂයෙහි ආයෝජනය කිරීමට සහ ඒ කොටස් සහ සුරැකුම්පත් විකිණීමට;

(ආ) යම් චංචල හෝ නිශ්චල දේපළක් සවිර වූ හෝ ආකාරයකින් අත්පත් කර ගැනීමට සහ දැරීමට, බද්දට හෝ කුලියට දීමට හෝ ගැනීමට, උකස් කිරීමට, හුවමාරු කිරීමට විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට;

(ඇ) කාර්යාංශයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්යාංශයේ පරමාර්ථ ක්‍රියාවේ යෙදීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හා එකඟවීම්වලට කෙළින්ම හෝ කාර්යාංශයේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් හෝ ඇතුළත් වීමට සහ ඒවා ඉටු කිරීමට;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ලබා ගන්නා ලද අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, කාර්යාංශය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් සහ එවැනි අය මත කාර්යාංශයේ කාර්ය සඳහා සවිර වූ හෝ ප්‍රකාශ යකින් මුදල් ණයට ගැනීමට;

(ඉ) ජීවනීය නිලධරයන්, සේවකයන් සහ නියෝජිතයන් පත් කිරීමට, ඔවුන්ගේ සේවය අවසන් කිරීමට, පාරිශ්‍රමික ගෙවීමට සහ පාලනය කිරීමට සහ එහි කටයුතු පරිපාලනය කිරීම හා සම්බන්ධ සියලු කාරණා මෙහෙයවීමට සහ නිරණය කිරීමට;

(ඊ) කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීමට;

(උ) කාර්යාංශයේ පරමාර්ථ ඵල ගැන්වීම පිණිස ක්‍රම සකස් කිරීමට;

(ඌ) ශ්‍රී ලාංකිකයන්ගේ සේවාවන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා යෝජකයන්ගෙන් ලැබෙන ඉල්ලීම් භාර ගැනීම හා බලපත්‍රලාභීන් අතර බෙදා හැරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටි නියම කිරීමට;

(එ) විදේශයන්හි රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් විසින් කාර්යාංශය වෙත ප්‍රේෂණය කරනු ලබන මුදල් ඔවුන් විසින් තෝරාගනු ලබන ආයෝජනවල ආයෝජනය කිරීමට

කාර්යාංශයට බලය තිබිය යුතු ය.

II වන කොටස

## කාර්යාංශයේ අරමුදල

කාර්යාංශයේ අරමුදල.

17. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) කාර්යාංශයේ අරමුදලක් තිබිය යුතු ය.

(2) (අ) ප්‍රදාන හෝ ණය වශයෙන් හෝ අත්තිකාරම්වශයෙන් ආණ්ඩුව විසින් කාර්යාංශයට සපයනු ලබන යම් මුදල් ;

(ආ) මේ පනත යටතේ නියම කොට එකතු කරනු ලබන යම් සෙස් බද්දකින් ලත් මුදල් ;

(ඇ) ගාස්තු සහ අයකිරීම් වශයෙන් කාර්යාංශය විසින් භාර ගන්නා ලද සියලු මුදල් ;

(ඈ) කාර්යාංශය විසින් කරන ලද යම් ආයෝජනවලින් ලැබෙන ආදායම් වශයෙන් කාර්යාංශය විසින් භාර ගන්නා ලද සියලු මුදල් ;

(ඉ) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කාර්යාංශය විසින් භාර ගන්නා ලද සියලු මුදල්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) අධ්‍යක්ෂවරයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ;

(ආ) කාර්යාංශයේ නිලධරයන්ට, සේවකයන්ට සහ සේවා නියුක්තකයන්ට ගෙවිය යුතු වැටුප් ;

(ඇ) කාර්යාංශයේ නියෝජිතයන්ට ගෙවිය යුතු යම් දීමනා ; සහ

(ඈ) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් කාර්යාංශය විසින් දරන ලද යම් වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල්

අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් විගණනය කිරීම.

18. (1) කාර්යාංශයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් ලැබීම් සහ ගෙවීම් පිළිබඳ ප්‍රකාශයක්, ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශයක්, වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශයක් සහ එක් එක් ආයෝජනයේ ප්‍රකාශිත විටිනාකම, ගැණුම් මිල සහ වෙළෙඳ විටිනාකම් දක්වෙන ආයෝජන පිළිබඳ ප්‍රකාශයක් කාර්යාංශය විසින් පිළියෙළ කරවනු ලැබිය යුතු ය. මේ උපවගන්තිය යටතේ පිළියෙළ කරන ලද එක් එක් ප්‍රකාශයේ පිටපතක්, ඊළඟ වර්ෂයේ සැප්තැම්බර් මස තිස්වන දිනට පෙර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව කාර්යාංශයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු බව.

**19.** කාර්යාංශය විසින්, කාර්යාංශයේ වැඩ පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව පිළියෙළ කොට ඒ වාර්තාව එය අදාළ වන්නා වූ වර්ෂයට පසුව එළඹෙන වර්ෂය ඉකුත්වීමට පෙර, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු ඒ වාර්තාව පාර්ලිමේන්තුවෙහි සභාගත කළ යුතු ය.

## III වන කොටස

## බඳවාලීම සහ සංවිධානය කිරීම

ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය බඳවාලීම සහ සංවිධානය කිරීම.

**20.** (1) ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා බඳවාලීම සහ සංවිධානය කිරීම සඳහා කාර්යාංශය විසින්—

(අ) විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමැතිය යටතේ විදේශ ආණ්ඩු සමග;

(ආ) විදේශීය සේවායෝජකයන් සහ නියෝජිතායතන සමග ගිවිසුම්වලට එළඹිය හැකි ය.

(2) ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්ති අවස්ථා විධිමත්කරණ වැඩසටහන් කාර්යාංශය විසින් ක්‍රියාවේ යෙදිය යුතු ය.

(3) බලපත්‍රලාභීන්ගේ බඳවාලීමේ කටයුතුවලදී ඔවුන්ට ආධාර කිරීමේ හා සහාය දීමේ බලය ද ඒ බලපත්‍රලාභීන්ගේ නියෝජිතයන් විදේශ චාරිකාවල යෙදීම සඳහා අනුග්‍රහ දැක්වීමේ බලය කාර්යාංශයට තිබිය යුතු ය.

කාර්යාංශයේ නියෝජිතයෝ.

**21.** වෙනත් රටවලින් පැමිණෙන්නන් සඳහා රක්ෂා ලබාගත හැකි යයි පිටරටවල කාර්යාංශයේ නියෝජිතයකු හෝ නියෝජිතයන් ලෙස තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි දෙනකු කාර්යාංශය විසින් විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමැතිය යටතේ පත් කරනු ලැබිය හැකි ය. ඒ නියෝජිතයන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් හෝ ඒ රටේ පදිංචිව සිටින ඒ රටේ පුරවැසියන් විය හැකි ය.

කාර්යාංශයේ නියෝජිතයන්ගේ කාර්ය.

**22.** කාර්යාංශය විසින් ස්වකීය නියෝජිතයන් වශයෙන් යම් පිටරටක පත්කරන ලද තැනැත්තන්—

(අ) ඒ රටෙහි ශ්‍රී ලාංකිකයන්ගේ සේවානියුක්තිය බඳවාලීම සම්බන්ධයෙන් වගකීම දැරිය යුතු ය;

(ආ) ඒ රටෙහි සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධනය ගැන වගකීම දැරිය යුතු ය;

(ඇ) සේවායෝජකයන් සමග ආරාවුල් බේරුම් කිරීම ඇතුළුව, ඒ රටෙහි සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම ගැන වගකීම දැරිය යුතු ය;

(ඈ) ඒ රටෙහි සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ පැමිණිලි ගැන සොයා බැලීම සහ ඒ පිළිබඳව සුදුසු පිළියම් ලබාදීම හෝ ඒ පිළියම් සම්බන්ධයෙන් කාර්යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම කළ යුතු ය;

(ඉ) කාර්යාංශය නියම කරන පරිදි වාරානුකූල වාර්තා එවිය යුතු ය.

හවුල් ව්‍යාපාර

23. ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තියට ලබාගැනීම සහතික කරනු පිණිස, රජය, සංස්ථා සහ පෞද්ගලික අංශයේ ව්‍යවසාය සමග හවුල් ව්‍යාපාර ආරම්භ කිරීමේ බලය කාර්යාංශය සතු විය යුතු ය.

## IV වන කොටස

### බලපත්‍රලත් විදේශ සේවා නියුක්ති නියෝජිතායතන විධිමත් කිරීම

විදේශ සේවා නියුක්ති නියෝජිතායතන බලපත්‍ර ලැබිය යුතු බව

24. (1) කාර්යාංශය හැර වෙනත් යම් තැනැත්තකු විසින් තමා වෙත මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකු විසින් සහ ඒ බලපත්‍රයේ නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූල ආකාරයකින් මිස විදේශ සේවා නියුක්ති නියෝජිතායතනයක ව්‍යාපාරය කරගෙන යනු නොලැබිය යුතු ය.

(2) නියමිත දිනයෙහි, 1980 අංක 32 දරන විදේශ සේවා නියුක්ති නියෝජිතායතන පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය මත විදේශ සේවා නියුක්ති නියෝජිතායතනයක ව්‍යාපාරය කරගෙන යන තැනැත්තකු විසින්, ඒ බලපත්‍රය මේ පනත යටතේ නිකුත් කරනු ලැබුවක් වූ සේ ම, ඒ බලපත්‍රය අවසන් වන තෙක්, ඒ ව්‍යාපාරය නොකඩවා කරගෙන යනු ලැබිය හැකි ය.

කාර්යාංශය විසින් විදේශ සේවා නියුක්ති නියෝජිතායතන ව්‍යාපාරය කරගෙන යා හැකි බව

25. කාර්යාංශය විසින් විදේශ සේවා නියුක්ති නියෝජිතායතනයක ව්‍යාපාරය කරගෙන යා හැකි අතර, කාර්යාංශය විසින් සිදු කරන ලද සේවා සම්බන්ධයෙන් ගාස්තු අය කරනු ලැබිය හැකි ය.

බලපත්‍රයක් ඉල්ලීම

26. (1) බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම, ලිඛිතව කාර්යාංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර, එහි පහත දැක්වෙන විස්තර ඇතුළත් විය යුතු ය:—

(අ) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය;

(ආ) ඉල්ලුම්කරු පුද්ගලයෙක් ද, ව්‍යාපාරික ආයතනයක් ද, සමාගමක් ද නැතහොත් රාජ්‍ය සංස්ථාවක් ද යන වග;

(ඇ) ඉල්ලුම්කරු—

(i) පුද්ගලයෙක් නම් ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග;

(ii) ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ද යන වග;

(iii) සමාගමක් නම්, සමාගමේ ප්‍රාග්ධනයෙහි කොටස් වලින් බහුතරය ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් දරනු ලබන්නේ ද යන වග;

(ආ) බලපත්‍රලාභියා ව්‍යාපාරික ආයතනයක් හෝ සමාගමක් නම්, ව්‍යාපාරය භාරව සිටින තැනැත්තාගේ සම්පූර්ණ නම සහ ලිපිනයත්;

(ඇ) බලපත්‍රලාභියා පුද්ගලයකු නම් ඔහු යහපත් චරිතයක් ඇති තැනැත්තෙක් ද යන වග;

(ඈ) බලපත්‍රලාභියා ව්‍යාපාරික ආයතනයක් හෝ සමාගමක් වන අවස්ථාවක, ව්‍යාපාරය භාරව සිටින තැනැත්තා යහපත් චරිතයක් ඇති තැනැත්තෙක් ද යන වග;

(ඉ) ව්‍යාපාරය කර ගෙන යනු ලබන ස්ථානයේ ලිපිනය සහ එම ස්ථානයේ කෙබිම් ප්‍රමාණය සහ ඇති පහසුකම්.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සහ (ඈ) ඡේදයේ විස්තර, අවස්ථාවෝචිත පරිදි බලපත්‍රලාභියාගේ හෝ ව්‍යාපාරය භාරව සිටින තැනැත්තාගේ චරිතය සහ කීර්තිය පිළිබඳව මනා දී ලබාගත් පිළිගත හැකි දෙදෙනකුගෙන් සනාථ කරනු ලැබිය යුතු ය.

27. (අ) බලපත්‍රලාභියා— බලපත්‍රය ප්‍රදානය කිරීමේ කොන්දේසි

(i) පුද්ගලයකු නම් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් මිස;

(ii) ව්‍යාපාරික ආයතනයක් නම් එහි හවුල්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන ව්‍යාපාරික ආයතනයක් නම් මිස; නැතහොත්

(iii) සමාගමක් නම් එහි කොටස්වලින් බහුතරය ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් දරනු ලබන සමාගමක් නම් මිස; සහ

(ආ) බලපත්‍රලාභියා පුද්ගලයකු නම් ඔහු හෝ ව්‍යාපාරික ආයතනයක් හෝ සමාගමක් සම්බන්ධයෙන් වන විට ව්‍යාපාරය භාරව සිටින තැනැත්තා හෝ යහපත් චරිතයක් ඇති තැනැත්තකු නම් මිස; සහ

(ඇ) ස්ථානය පිහිටි ප්‍රදේශය, ස්ථානයේ ප්‍රමාණය සහ එම ස්ථානයේ ඇති පහසුකම් කෙරෙහි සැලකිල්ල ඇතිව, ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානය සුදුසු එකක් නම් මිස;

(ඈ) බලපත්‍රය නිකුත් කිරීම සඳහා නියමිත ගාස්තුව බලපත්‍රලාභියා විසින් ගෙවා ඇත්නම් මිස;

(ඉ) 28 වන වගන්තියේ නියමයන් අනුව ඉල්ලුම්කරු කටයුතු කර ඇත්නම් මිස

විදේශ සේවා නියුක්ති නියෝජිතායතන ව්‍යාපාරය පවත්වා ගෙන යාමට බලපත්‍රයක් ප්‍රදානය නොකළ යුතු ය.

බලපත්‍රය නිකුත් කිරීමට පෙර කාර්යාංශය විසින් නිකුත් කරන ලද නියමයන්ට අනුකූලව ඉල්ලුම්කරු කටයුතු කළ යුතු බව.

28. (1) මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර—

(අ) (i) සදාචාරාත්මක විලාසයෙන් නිරවද්‍ය ආකාරයකින් ව්‍යාපාරය පවත්වාගෙන යාමට ; සහ

(ii) විදේශ සේවායෝජකයකු සහ ඉල්ලුම්කරු විසින් ඒ සේවායෝජකයා යටතේ සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලබන තැනැත්තකු අතර වූ යම් සේවා නියුක්ති ගිවිසුමක නියමයන් සහ කොන්දේසි ඒ සේවායෝජකයා විසින් පිළිපදිනු ලබන බව සහතික කිරීම පිණිස හැකි යුක්තිසහගත පියවර සියල්ල ගැනීමට

කාර්යාංශය සමග ගිවිසුමකට ඇතුළු වීමට;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් ව්‍යාපාරය හෝ යම් සේවා නියුක්ති ගිවිසුමක් සම්බන්ධයෙන් උද්ගත විය හැකි හිමිකම් පියවීම සඳහා, කාර්යාංශය විසින් නියම කරනු ලබන පරිදි වූ රුපියල් එක් ලක්ෂයකට නොඅඩු මුදලකට ඇප කරුවන් දෙදෙනකු ඇතිව කාර්යාංශය සමග බැඳුම්කරයකට ඇතුළු වීමට;

(ඇ) (අ) ඡේදයෙහි සඳහන් ව්‍යාපාරය හෝ යම් සේවා නියුක්ති ගිවිසුමක් සම්බන්ධයෙන් උද්ගත විය හැකි යම් හිමිකම් පියවීම සඳහා බලපත්‍රය නිකුත් කිරීමේ දින සිට අනුක්‍රමික මාස විසිහතරක කාලයක් බලාත්මකව පවත්නා, කාර්යාංශය විසින් නියම කරනු ලබන පරිදි වූ රුපියල් එක් ලක්ෂයකට නොඅඩු මුදලකට කාර්යාංශය නාමයට පත් වන පරිදි බැංකු ඇප සහතිකයක් තැබීමට; සහ

(ඈ) බලපත්‍රය සඳහා නියමිත ගාස්තුව ගෙවීමට

කාර්යාංශය විසින් ඉල්ලුම්කරුට නියම කළ යුතු ය.

(2) කාර්යාංශය විසින්, බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් කරන රජයේ සංස්ථාවක් (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදයන්හි සඳහන් නියමයන්ගෙන් නිදහස් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද නියමය අනුව ඉල්ලුම්කරු කටයුතු නොකරන අවස්ථාවක, ඒ ඉල්ලුම්කරුට බලපත්‍රයක් ප්‍රදානය කිරීම කාර්යාංශය විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

බලපත්‍රයේ ආකෘතිය සහ බලාත්මක කාලය.

29. සෑම බලපත්‍රයක් ම—

(අ) නියමිත ආකෘතිය අනුව විය යුතු ය; තව ද

(ආ) එය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එය නිකුත් කරන ලද දින සිට මාස දොළහක කාලයක් බලාත්මක විය යුතු ය.

**බලපත්‍රයක් අලුත් කිරීම.**

30. (අ) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ මේ පනත යටතේ බලපත්‍රලාභියා ඇතුළත් වූ යම් ගිවිසුමක හෝ බැඳුම්කරයක විධිවිධාන බලපත්‍රලාභියා විසින් පිළිපැද ඇති බවට, සහ මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ යම් වරදකට බලපත්‍රලාභියා වරදකරු කරනු ලැබ නොමැති බවට සහ මේ පනත යටතේ සාදන ලද යම් විධානයක් අනුව බලපත්‍රලාභියා ක්‍රියා කර ඇති බවට කාර්යාංශය තෘප්තිමත් වී ඇත්නම් ; සහ

(ආ) බලපත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව බලපත්‍රලාභියා විසින් ගෙවා ඇත්නම්

බලපත්‍රය අවසන් වීමට පෙර දින තිහකට නොඅඩුව කාර්යාංශය වෙත කරනු ලබන ඉල්ලීමක් මත, වරකට එක් වර්ෂයක් නොඉක්මවන කාල සීමාවක් හෝ කාල සීමාවන් සඳහා කාර්යාංශය විසින් බලපත්‍රය අලුත් කරනු ලැබිය හැකි ය.

**බලපත්‍රයක් අවලංගු කිරීම.**

31. (1) බලපත්‍රලාභියා විසින්—

(i) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ මේ පනත යටතේ බලපත්‍රලාභියා ඇතුළත් වූ යම් ගිවිසුමක හෝ බැඳුම්කරයක විධිවිධාන කිසිවක් කඩකර ඇති බවට ;

(ii) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වරදකට වරදකරු කරනු ලැබ ඇති බවට ;

(iii) 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය යටතේ බලපත්‍රලාභියාට කාර්යාංශය විසින් නිකුත් කරන ලද යම් විධානයක් අනුව කටයුතු කර නොමැති බවට ;

(iv) මේ පනත යටතේ ගෙවීමට නියම කරනු ලැබූ යම් ගෙවල් ගෙවීම පැහැර හැර ඇති බවට ;

(v) 44 වන වගන්තිය යටතේ කාර්යාංශය විසින් යම් තැනැත්තකුට ගෙවිය යුතු යයි නියම කරනු ලැබූ යම් මුදලක් ගෙවීම පැහැර හැර ඇති බවට ; හෝ

(vi) මේ පනත යටතේ බලපත්‍රලාභියා විසින් යවන ලද යම් ඉල්ලීමක හෝ යම් වාර්තාවක හෝ යම් ලිඛිත තොරතුරක හෝ ලිඛිත කරුණු දැක්වීමක බලපත්‍රලාභියාගේ දැනීම අනුව අසත්‍ය වූ හෝ සාවද්‍ය වූ යම් විස්තර සඳහන් ඇති බවට

කාර්යාංශය තෘප්තිමත් වුවහොත්, මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් කාර්යාංශය විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) කාර්යාංශයේ තීරණයට විරුද්ධව අභියාචනා කිරීම සඳහා වූ කාලය ඉකුත් වන තෙක් හෝ ඒ කාලය ඇතුළත අභියාචනයක් කරනු ලැබ ඇත්නම්, ඒ අභියාචනය ප්‍රතික්ෂේප කරනු ලබන තෙක් හෝ ඉවත් කෙරෙන තෙක් (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම ක්‍රියාත්මක නොවිය යුතු ය.

කාර්යාංශය විසින් ගනු ලබන තීරණය සඳහා වූ හේතු සහිත ඉල්ලුම්කරුට හෝ බලපත්‍රලාභියාට දැන්විය යුතු බව.

32. බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ බලපත්‍රයක් අවලංගු කිරීමට හෝ කාර්යාංශය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, කාර්යාංශය විසින්, අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරුට හෝ බලපත්‍රලාභියාට එම තීරණය, ඊට පදනම් වූ හේතු සහිත දැනුම් දෙනු ලැබිය යුතු ය.

අභියාචනා

33. (1) (අ) බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරන; හෝ

(ආ) තම බලපත්‍රය අවලංගු කරන කාර්යාංශයේ තීරණය නිසා අතෘප්තියට පත්, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභියා විසින්, ඒ තීරණය තමාට දන්වනු ලැබූ දින සිට දින දහහතරක් ඇතුළත, ඊට විරුද්ධව අමාත්‍යවරයා හෝ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් අභියාචනයක් මත ඒ ලේකම්වරයා විසින්—

(අ) අභියාචනය පිළිගෙන බලපත්‍රයක් ප්‍රදානය කරන ලෙස හෝ අලුත් කරන ලෙස කාර්යාංශයට විධාන කළ හැකි ය; නැතහොත්

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කාර්යාංශයට නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව කාර්යාංශය ක්‍රියා කළ යුතු ය.

බලපත්‍රලාභියා විසින් යම් ගාස්තුවක් අය නොකළ යුතු බව.

34. යම් තැනැත්තකුට ශ්‍රී ලංකාවෙන් පිටත යම් රටක සේවා නියුක්තිය සැලසීම හෝ ලබා දීම සඳහා 51 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, අන්‍යාකාරයකින් බලපත්‍රලාභියකු විසින් කිසිම ගාස්තුවක් අය නොකළ යුතු ය.

බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතු බව.

35. බලපත්‍රලාභියා විසින් ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබන ස්ථානයෙහි තමාට ප්‍රදානය කරන ලද බලපත්‍රය ප්‍රකට ලෙස ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

විස්තර සම්බන්ධයෙන් යම් වෙනසක් බලපත්‍රලාභියා විසින් කාර්යාංශයට දැනුම් දිය යුතු බව.

36. (1) බලපත්‍රයක් සඳහා වූ තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන ලද විස්තර සම්බන්ධයෙන් වන යම් වෙනසක්, එය සිදු වූ දින සිට දින තිහක් ඇතුළත, බලපත්‍රලාභියා විසින් කාර්යාංශය වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(2) බලපත්‍රයේ නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූල නො වන ආකාරයකින් යම් ව්‍යාපාරයක් පවත්වා ගෙන යෑමට (1) වන උපවගන්තියේ කිසිවකින් බලපත්‍රලාභියාට බලය නොලැබෙන්නේ ය.

කාර්යාංශයේ අනුමතය නොමැතිව බඳවා ගැනීම සම්බන්ධයෙන් ක්‍රියා නොකළ යුතු බව.

37. (1) කාර්යාංශයේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව, බලපත්‍රලාභියකු විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා තැනැත්තන්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවමින් යම් ප්‍රචාරක දැන්වීමක් හෝ දැන්වීමක් නිකුත් කිරීම හෝ ඒ සේවානියුක්තිය සම්බන්ධයෙන් තැනැත්තන්ට ආනුෂංගික වෙනත් යම් ක්‍රියාවක් හෝ නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කාර්යාංශයේ අනුමතය ලබා ගැනීමේ කාර්යය සඳහා බලපත්‍රලාභියා විසින් පහත දැක්වෙන විස්තර කාර්යාංශය වෙත ඉදිරිපත් කළ යුතු ය:—

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත වූ අනාගත සේවායෝජකයාගේ නාම සහ ලිපිනය ;

(ආ) තැනැත්තන් බඳවා ගැනීම සඳහා බලපත්‍රලාභියා සහ විදේශ සේවායෝජකයා විසින් ඇතුළත් වූ ගිවිසුමේ හෝ එකඟතාවයේ පිටපතක් ;

(ඇ) තැනැත්තන් බඳවා ගනු ලබන්නේ කවර ස්වභාවයක සේවා නියුක්තියක් සඳහා ද යන වග ;

(ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලබන තැනැත්තන්ට සේවායෝජකයා විසින් ඉදිරිපත් කරනු ලබන්නා වූ ද, වේතන, නිවාඩු, වැඩ කරන කාලය සහ ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාවට ගමන් ගාස්තුව ගෙවා දීමට අදාළ නියමයන් [illegible] කොන්දේසි ඇතුළුව සේවානියුක්තිය පිළිබඳ නියමයන් සහ කොන්දේසි ; සහ

(ඉ) නියම කරනු ලබන වැඩිදුර විස්තර.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද විස්තර ප්‍රමාණවත් නොවන අවස්ථාවක, අවශ්‍ය යයි කාර්යාංශය සලකන අතිරේක විස්තර කාර්යාංශය විසින් කැඳවනු ලැබිය හැකි ය.

(4) තැනැත්තන්ගේ සේවානියුක්තිය පිළිබඳ සාමාන්‍ය ප්‍රමිති අනුව තැනැත්තන් බඳවා ගනු ලබන සේවානියුක්තියේ ස්වභාවය පහත් හෝ අතෘප්තිමත් වන බවට හෝ ඒ සේවානියුක්තියේ නියමයන් සහ කොන්දේසි අයුක්ති සහගත බවට කාර්යාංශය සෑහීමට පත්වන යම් අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ අනුමතය ප්‍රදානය කිරීම මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(5) (2) වන සහ (3) වන උපවගන්ති යටතේ කාර්යාංශය වෙත ඉදිරිපත් කරන ලද යම් තොරතුරක්, මේ පනත යටතේ තම කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා කාර්යාංශයේ නිලධරයකුට හෝ යම් අධිකරණයකට හැර වෙනත් යම් තැනැත්තකුට බලපත්‍රලාභියාගේ කැමැත්ත නොමැතිව කාර්යාංශය විසින් හෙළි නොකළ යුතු ය.

ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා තැනැත්තන් බඳවා ගැනීම සම්බන්ධ පරීක්ෂණයේ දී බලපත්‍රලාභී නිලධරයාට පැමිණ සිටිය හැකි බව.

38. මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානවලට අනුකූලවීම සහතික කිරීමේ කාර්යය සඳහා, 37 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද අනුමතියක් ප්‍රකාර බලපත්‍රලාභියා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා තැනැත්තන් බඳවා ගැනීම පිණිස වූ යම් සම්මුඛ පරීක්ෂණයක දී කාර්යාංශය විසින් තම කාර්යය සඳහා ලිඛිතව බලය දෙන ලද නිලධරයකුට පැමිණ සිටිය හැකි ය. තවද ඒ නිලධරයාට එසේ පැමිණ සිටීම පිණිස සියලු පහසුකම් සැලසීම ඒ බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

අනුමතිය ප්‍රදානය නොකළ හැකි හේතු.

39. (1) ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා යම් රටකට හෝ වර්ගයකට අයත් තැනැත්තන් බඳවා ගැනීම සඳහා 37 වන වගන්තිය යටතේ අනුමතිය ප්‍රදානය කිරීම—

(i) කාර්යාංශයේ මතය අනුව—

(අ) ඒ තැනැත්තන් වෙත අර්පණය කරනු ලබන සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි සතුටුදායක නොවේ නම්, හෝ

(ආ) ඒ තැනැත්තන් සේවයෙහි නියුක්ත කරනු ලබන රටෙහි ඇති යම් සිවිල් උපද්‍රවයක් මහජන කැළඹීමක් හෝ දේශපාලන වියාකූලතා හේතුවෙන් ඔවුන්ගේ ජීවිතය බරපතල අවදානමකට ලක් විය හැකි නම්;

(ii) යෝජිත සේවා නියුක්තිය ඒ රටෙහි නීතියෙන් අනුමත කොට නොමැති නම්

කාර්යාංශය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා යම් රටකට හෝ වර්ගයකට අයත් තැනැත්තන් බඳවා ගැනීම සඳහා 37 වන වගන්තිය යටතේ අනුමතිය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරන කාර්යාංශයේ තීරණයකින් අතෘප්තියට පත් බලපත්‍රලාභියකු විසින්, ඔහුට ඒ තීරණය දන්වනු ලැබූ දින සිට දින දහහතරක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ යම් අභියාචනයක් කරනු ලැබූ විට, ඒ ලේකම්වරයා විසින්—

(අ) අභියාචනය පිළිගෙන, අභියාචනය අදාළ වන රටකට හෝ වර්ගයකට අයත් තැනැත්තන් බඳවා ගැනීම අනුමත කරන ලෙස කාර්යාංශයට විධාන කළ හැකි ය; නැතහොත්

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කළ හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කාර්යාංශය වෙත නිකුත් කරනු ලැබූ යම් විධානයකට අනුකූලව කාර්යාංශය ක්‍රියා කළ යුතු ය.

සේවානියුක්ති ගිවිසුම.

40. (1) විදේශ සේවායෝජකයා සහ ඒ සේවායෝජකයා විසින් සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ තැනැත්තා අතර වූ සේවානියුක්ති ගිවිසුම, ඒ සේවායෝජකයා නැතහොත් ඔහුගේ අනුයෝජිතයා විසින් සහ ඒ තැනැත්තා විසින් අත්සන් කිරීමට පෙර, ඒ තැනැත්තාට වැටහෙන භාෂාවකින් කියවා පැහැදිලි කර දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් ගිවිසුම අත්සන් කරනු ලැබූ විගසම ඒ ගිවිසුමේ පිටපත් දෙකක් කාර්යාංශය විසින් සහතික කරනු පිණිස සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිටත්වීමට පෙර, බලපත්‍රලාභියා විසින් හෝ ඒ අනුයෝජිතයා විසින් කාර්යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ඒ ගිවිසුමේ පිටපත්, (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කාර්යාංශය විසින් සහතික කරනු ලැබූ විගසම, ඒ බව කාර්යාංශය විසින් ඒ බලපත්‍රලාභියාට හෝ අනුයෝජිතයාට හෝ දැනුම් දෙනු ලැබිය යුතු අතර, ලියාපදිංචි කිරීම පිණිස ඉන් එක් පිටපතක් සේවානියුක්ති ගිවිසුම ඉටුකරනු ලබන්නේ යම් රටක ද ඒ රටේ කම්කරු අමාත්‍යාංශය වෙත කාර්යාංශය විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

වාර්තා පවත්වාගෙන යාම.

41. සෑම බලපත්‍රලාභියකු විසින් ම, නියම කරනු ලබන වාර්තා පවත්වාගෙන යා යුතු ය.

විස්තර වාර්තා.

42. (1) කාර්යාංශය විසින් ලිඛිත විධානයක් මගින්, ඒ විධානයෙහි නිශ්චිතව සඳහන් දිනයට පෙර—

(අ) බලපත්‍රලාභියා විසින් පවත්වාගෙන යනු ලබන විදේශ සේවානියුක්ති නියෝජිතායතනයේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් කාර්යාංශයට අවශ්‍ය වන යම් විස්තර ඇතුළත් විස්තර වාර්තාවක් ;

(ආ) බලපත්‍රලාභියා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා යම් තැනැත්තකු බඳවා ගනු ලබන්නේ යම් සේවායෝජකයකු වෙනුවෙන් ද ඒ සේවායෝජකයා විසින් එවන ලද හෝ එවිය යුතු කොමිස් මුදල ශ්‍රී ලංකාවේ බැංකුවකට ප්‍රේෂණය කළ බවට සාක්ෂි ; සහ

(ආ) බලපත්‍රලාභියා විසින් එවනු ලද යම් විස්තර වාර්තාවක ප්‍රකාශිත යම් විස්තර සම්බන්ධයෙන් කාර්යාංශයට අවශ්‍ය විය හැකි යම් ලිඛිත තොරතුරු, හෝ යම් ලිඛිත පැහැදිලි කිරීම් කාර්යාංශය වෙත එවන ලෙස කවර වූ හෝ අවස්ථාවක දී බලපත්‍රලාභියකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විධානයක් නිකුත් කරනු ලැබූ යම් බලපත්‍රලාභියකු විසින්, ඒ විධානයෙහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඒ අනුව ක්‍රියා කළ යුතු ය.

කාර්යාංශයේ විධාන

43. බලපත්‍රලාභියකු මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලද යම් නියෝගයක් අනුව ක්‍රියා කරවීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි කාර්යාංශය කල්පනා කරන යම් විධාන, කාර්යාංශය විසින් බලපත්‍රලාභියකු වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, එවැනි යම් විධානයක් නිකුත් කරනු ලැබූ බලපත්‍රලාභියකු විසින් ඒ විධානයෙහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත දී ඒ විධාන අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ තැනැත්තන් විසින් කරනු ලබන පැමිණිලි විභාග කිරීම.

44. (1) (අ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ සේවානියුක්ති ගිවිසුමෙන් ඒ තැනැත්තා වෙනුවෙන් යම් සේවායෝජකයකුට නියම කරනු ලැබූ නියමයන් සහ කොන්දේසි ඒ සේවායෝජකයා විසින් පිළිපැද නැති බවට; සහ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා ඒ තැනැත්තා බඳවා ගත් බලපත්‍රලාභියා, 28 (1) (අ) වගන්තිය යටතේ තම කාර්යාංශය සමග ඇතුළත් වූ ගිවිසුම කඩකරමින් එකී නියමයන් සහ කොන්දේසි සේවායෝජකයා විසින් පිළිපදිනු ලබන බව සහතික කිරීමට යුක්තිසහගත ලෙස ගතහැකි පියවර ගැනීම පැහැර හැර ඇති බවට

ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත වූ යම් තැනැත්තකුගෙන් හෝ ඔහු වෙනුවෙන් හෝ පැමිණිල්ලක් හෝ ස්වකීය විදේශ නියෝජිතයන් අතුරින් කිසිවකුගෙන් යම් වාර්තාවක් කාර්යාංශයට ලැබුණු අවස්ථාවක, කාර්යාංශය විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින්, අවශ්‍ය යයි ඔහු සලකන පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව, ඒ පැමිණිල්ලෙහි හෝ වාර්තාවෙහි දක්වා ඇති කාරණා ඔප්පු කරනු ලැබූ බව තීරණය කළහොත්, ඒ තැනැත්තාට ලැබිය යුතු නොගෙවන ලද වේතනය, නිවාඩු දින වෙනුවෙන් වූ ගෙවීම්, නිවාඩු සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ යනාදියේ වටිනාකම් සහ සේවායෝජකයා විසින් එම කොන්දේසි කඩ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ තැනැත්තා විසින් දරනු ලැබූ ශ්‍රී ලංකාවට පැමිණීමේ ගමන් ගාස්තු ඇතුළුව වෙනත් වියදම් පියවීම සඳහා ප්‍රමාණවත් යයි ඔහු තීරණය කරන මුදල් ප්‍රමාණයක් ඒ තැනැත්තාට ගෙවන ලෙස බලපත්‍රලාභියාට විධාන කෙරෙන ප්‍රදානයක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් නිලධරයාට (1) වන උපවගන්තිය යටතේ පරීක්ෂණයක් පැවැත්වීමේ කාර්යය සඳහා—

(අ) පරීක්ෂණයෙහි විෂය වන පැමිණිල්ල [illegible] වාචිකව සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම සඳහා බලපත්‍රලාභියාද සහ පැමිණිලිකරුට පැමිණ සිටින ලෙස නියම කිරීමට;

(ආ) පරීක්ෂණයේ කාර්යය සඳහා අවශ්‍ය යයි තමා සලකන ලේඛන ඉදිරිපත් කරන ලෙස බලපත්‍රලාභියාට සහ පැමිණිලිකරුට නියම කිරීමට; සහ

(ඇ) යම් තැනැත්තකුට දිවුරුම් පිට හෝ ප්‍රතිඥාකාරයෙන් තමා ඉදිරිපිට සාක්ෂි දෙන ලෙස නියම කිරීමට

බලය ඇත්තේ ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් නිලධරයා විසින් ඒ උපවගන්තිය යටතේ පවත්වනු ලබන යම් පරීක්ෂණයක දී, එහි බලපත්‍රලාභියාට සහ පැමිණිලිකරුවන්ට කරුණු කියා සිටීමේ අවස්ථාවක් ලබාදිය යුතු ය.

(4) (1) වන උපවගන්තියෙහි සඳහන් නිලධරයා විසින් ඒ උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට ගෙවන ලෙස බලපත්‍රලාභියා හට නියම කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක්, විදේශ සේවා නියුක්ති නියෝජිතායතනයේ ව්‍යාපාරය පවත්වා ගෙන යාමට ඒ බලපත්‍රලාභියාට දෙන ලද බලපත්‍රය අදාළ වන ස්ථානය පිහිටියේ යම් දිසා අධිකරණයක පරිපාලන සීමා ඇතුළත නම් ඒ දිසා අධිකරණයෙන් ලඝු කාර්ය පරිපාටිය අනුව පවරන ලද නඩුවක් මඟින් ඒ තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් කාර්යාංශය විසින් හෝ අයකර ගනු ලැබිය යුතු ය. ලඝු කාර්ය පරිපාටිය යෙදෙන නඩුවලට අදාළ සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන මේ උපවගන්තිය යටතේ වූ නඩුවකට අදාළ විය යුතු ය.

## V වන කොටස

## කම්කරුවන්ගේ සුභසාධන අරමුදල

45. (1) කාර්යාංශය විසින්, (මෙහි මින්මතු "සුභසාධන අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) කම්කරුවන්ගේ සුභසාධන අරමුදලක් ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ යහපත පිණිස පිහිටුවිය යුතු ය. කම්කරුවන්ගේ සුභසාධන අරමුදල.

(2) සුභසාධන අරමුදලට—

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන් ගෙන් ලැබුණු සියලු පරිත්‍යාග සහ දායක මුදල්;

(ආ) විදේශීය සේවායෝජකයන්ගෙන් සහ බලපත්‍රලාභීන්ගෙන් ලැබුණු සියලු පරිත්‍යාග සහ දායක මුදල්;

(ඇ) (අ) සහ (ආ) ඡේදවල සඳහන් නොවන වෙනත් යම් ප්‍රභවයකින් ලැබුණු පරිත්‍යාග සහ දායක මුදල් ;

(ඈ) කාර්යාංශය විසින් සුභසාධන අරමුදලට පවරනු ලබන මුදල් ප්‍රමාණයන්

ගෙවිය යුතු ය.

සුභසාධන අරමුදලට ගෙවිය යුතු මුදල් බැංකුවෙහි තැන්පත් කළ යුතු බව.

46. කාර්යාංශය විසින් භාර ගන්නා ලද සුභසාධන අරමුදලට ගෙවිය යුතු සියලු මුදල් අනුමත කළ බැංකුවක තැන්පත් කළ යුතු අතර "කම්කරුවන්ගේ සුභසාධන අරමුදල් ගිණුම" යනුවෙන් වූ ගිණුමකට බැර කළ යුතු ය.

මේ වගන්තියේ "අනුමත කළ බැංකුව" යන්නෙන්, සුභසාධන අරමුදලට ගෙවිය යුතු මුදල් තැන්පත් කරනු ලැබිය හැකි බැංකුවක් වශයෙන්, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් බැංකුවක් අදහස් වේ.

අරමුදලේ මුදල් ආයෝජනය කිරීමේ බලය.

47. සුභසාධන අරමුදලේ මුදල්, අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ආයෝජනයක කාර්යාංශය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

අරමුදලේ මුදල් යෙදවීම.

48. (1) කාර්යාංශය විසින්—

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තියෙන් පසුව ශ්‍රී ලංකාවට ආපසු පැමිණෙන ශ්‍රී ලාංකිකයන් සඳහා වූ පුනරුත්ථාපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කාර්යාංශය විසින් දරන ලද සියලු වියදම් ;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ පවුල්වලට උපදෙස් සහ තොරතුරු සැපයීම සම්බන්ධයෙන් කාර්යාංශය විසින් දරන ලද සියලු වියදම් ;

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ ශ්‍රී ලාංකිකයන් පුහුණු කිරීම සහ හුරු කිරීම සම්බන්ධයෙන් දරන ලද සියලු වියදම් ;

(ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආධාර දීමෙහි ලා දරන ලද සියලු වියදම්

සුභසාධන අරමුදලින් ගෙවිය යුතු ය.

(2) කාර්යාංශයේ යෝජනා සම්මතයක බලය සහිතව මිස සුභසාධන අරමුදලින් කිසිම ගෙවීමක් නොකළ යුතු ය.

49. සුභසාධන අරමුදලේ ගිණුමින් මුදල් ගෙවීම සඳහා වූ සියලු ඇණවුම් හෝ චෙක්පත් සභාපතිවරයා විසින් හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට සභාපතිවරයා විසින් බලය දෙනු ලැබූ අධ්‍යක්ෂවරයකු විසින් සහ තත් කාර්යය සඳහා කාර්යාංශය විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ නිලධරයන් අතුරින් වෙනත් එක් නිලධරයකු විසින් අත්සන් කරනු ලැබිය යුතු අතර සුභසාධන අරමුදලේ ගිණුමේ මුදල් තැන්පත් කොට ඇති බැංකුව විසින් එසේ අත්සන් කරන ලද ඒ ගිණුම මත වූ සියලු ඇණවුම්වලට හෝ චෙක්පත්වලට ගෙවිය හැකි ය. අරමුදලින් ගෙවීම සඳහා ඇණවුම්... චෙක්පත් අත්සන

50. මණ්ඩලයේ එක් එක් රැස්වීමේ දී සුභසාධන අරමුදල් සම්බන්ධයෙන් ලැබීම් සහ ගෙවීම් පිළිබඳ ප්‍රකාශයක් සභාපතිවරයා විසින් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය. සුභසාධන අරමුදල සම්බන්ධයෙන් ලැබීම් සහ ගෙවීම් ආදිය පිළිබඳ ප්‍රකාශය.

## VI වන කොටස

### ගෙවීම් සහ සෙස් බද්ද

51. (1) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලබන සෑම තැනැත්තකු විසින් ම රුපියල් දෙදහස් පන්සියයක මුදලක් කාර්යාංශයට ගෙවිය යුතු ය. බඳවා ගනු ලබන්නන් විසින් ගෙවීම.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලබන සෑම තැනැත්තකු විසින් ම, ඔහු ශ්‍රී ලංකාවෙන් පිටත්ව යාමට පෙර කාර්යාංශය විසින් සලසන ලද පහසුකම් සඳහා ගෙවීමක් වශයෙන් රුපියල් දෙසියයක මුදලක් කාර්යාංශයට ගෙවිය යුතු ය.

(3) කාර්යාංශය විසින් අනුමත කරන ලද යම් බැංකුවක් මඟින් කාර්යාංශයට ගෙවීම් කරනු ලැබිය යුතු ය.

(4) බලපත්‍රලාභියකු විසින් යම් තැනැත්තකු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සලසනු ලැබූ හෝ ලබා දී ඇති අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ඒ තැනැත්තා විසින් කාර්යාංශයට ගෙවන ලද මුදලින්, රුපියල් දෙදහසක මුදලක් කාර්යාංශය විසින් බලපත්‍රලාභියාට ගෙවිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ ගෙවීමට බඳවා ගනු ලබන්නා අද නියම කරනු ලබන මුදල සම්පූර්ණයෙන් ගෙවීමට සිදුවී නො හැකි බවට පරීක්ෂණයකින් පසුව කාර්යාංශය තීරණය කරන අවස්ථාවක, කාර්යාංශය විසින් අනුමත කරන ලද යම් බැංකුවක් මඟින් ඒ බඳවා ගනු ලබන්නා විසින් වාරිකවලින් ගෙවීම කිරීම පිණිස කාර්යාංශය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(6) බැංකුවක් මඟින් කාර්යාංශයට ගෙවීම් කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

සෙස් බද්ද.

52. (1) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා යම් තැනැත්තකු බඳවා ගැනීම සම්බන්ධයෙන් බලපත්‍රලාභියකු විසින් ලබා ගත් සෑම කොමිස් මුදලකින්ම නියමයට පත්ත අනුප්‍රමාණයෙන් ගණන් බලනු ලැබූ සෙස් බද්දක් සෑම බලපත්‍රලාභියකු කෙරෙන් නියම කොට අය කළ යුතු ය.

(2) සෑම බලපත්‍රලාභියකු විසින් ම, ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා තැනැත්තන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ඉකුත් මාසයේදී ඔහු ලබා ගත් කොමිස් මුදල පිළිබඳ වාර්තාවක් සෑම මාසයක පසළොස්වන දිනට පෙර කාර්යාංශය වෙත සැපයිය යුතු ය.

(3) සෑම බලපත්‍රලාභියකු විසින් ම, මේ වගන්තිය යටතේ ගෙවිය යුතු සෙස් බද්ද ඒ සෙස් බද්ද අය කෙරෙන්නේ යම් කොමිස් මුදලක් සම්බන්ධයෙන් ද, ඒ කොමිස් මුදල ලැබීමේ දින සිට මාස තුනක් ඇතුළත කාර්යාංශයට ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ නියම කර අය කරනු ලබන සෙස් බද්ද තක්සේරු කිරීම, එකතු කිරීම සහ අයකර ගැනීම නියෝග මගින් නියම කරනු ලද පරිදි විය යුතු ය.

## VII වන කොටස

### තොරතුරු දත්ත බැංකුව

තොරතුරු දත්ත බැංකුව.

53. (1) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත වන සහ ඒ සේවානියුක්තිය නිමවීමෙන් පසුව පෙරළා පැමිණෙන ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් තොරතුරු දත්ත බැංකුවක් කාර්යාංශය විසින් පැවැත්විය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා තමා විසින් බඳවා ගනු ලබන ශ්‍රී ලාංකිකයන් පිළිබඳ නියමිත තොරතුරු සෑම බලපත්‍රලාභියකු විසින්ම කාර්යාංශය වෙත සැපයිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බැහැර යන සෑම ශ්‍රී ලාංකිකයකු විසින් ම, එසේ පිටත් ව යාමට පෙර කාර්යාංශය වෙත ලියාපදිංචි විය යුතු ය.

## VIII වන කොටස

### බලපත්‍රලත් විදේශ සේවානියුක්ති නියෝජිතායතන සංගමය

බලපත්‍රලත් විදේශ සේවානියුක්ති නියෝජිතායතන සංගමය පිහිටුවීම.

54. (1) නියමිත දිනට පසු, හැකි ඉක්මනින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) බලපත්‍රලත් විදේශ සේවානියුක්ති නියෝජිතායතන සංගමය අමාත්‍යවරයා විසින් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන සංගමය සංස්ථාවක් විය යුතු අතර, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඊට තිබිය යුතු ය. තවද, ඒ සංගමය පිහිටුවීමේ නියමය මගින් ඊට දෙනු ලබන නාමයෙන් නඩු පැවරීම ද, නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

(3) සෑම බලපත්‍රලාභියකු ම සංගමයේ සාමාජිකයකු විය යුතු ය

සංගමයේ කාර්යයන

55. සංගමයේ කාර්යයන—

(අ) බලපත්‍රලාභීන් අතර ආරවුල් සහ මත භේද විසඳීම ;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය නංවාලීම සහ විධිමත් කිරීම සම්බන්ධයෙන් කාර්යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඇ) ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්ති අවස්ථා නංවාලීම පිළිබඳව උපදෙස් දීම සහ එකිලා සහාය වීම ;

(ඈ) බලපත්‍රලාභීන් සඳහා චර්යාධර්ම සංග්‍රහයක් සකස් කිරීම සහ එය ක්‍රියාවේ යෙදෙන බව සහතික කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීම හා සම්බන්ධ කාරණා පිළිබඳ ව කාර්යාංශයට සහ අමාත්‍යවරයාට කරුණු ඉදිරිපත් කිරීම

විය යුතු ය.

සංගමයේ කටයුතු පිළිබඳ කළමනාකරණය

56. (1) සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික සහ සාමාජිකයන් විසින් තමන් අතුරින් තත්කාර්ය සඳහා තෝරා පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත වන සංගමයේ විධායක කාරක සභාව විසින් සංගමයේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(2) සංගමයේ විධායක කාරක සභාවේ ධූර කාලය එක් වර්ෂයක් විය යුතු ය.

සංගමයේ කාරක සභා බලතල

57. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංගමය වෙනුවෙන් සංගමයේ කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීමට, ඉටු කිරීමට සහ ක්‍රියාවේ යෙදවීමට සංගමයේ විධායක කාරක සභාවට බලය ඇත්තේ ය.

සංගමයේ කාර්ය පටිපාටිය ආදිය

58. සංගමයේ විධායක කාරක සභාව තෝරා පත්කිරීම සඳහා සහ සංගමයේ හා විධායක කාරක සභාවේ රැස්වීම් කැඳවීම සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය. එබඳු යම් නියෝගයකට යටත්ව, සංගමය විසින් සහ විධායක කාරක සභාව විසින් ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකිය.

## IX වන කොටස

### කාර්යාංශයේ කාර්ය මණ්ඩලය

නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

59. (1) ස්වකීය කාර්යයන් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි කාර්යාංශය සලකන නිලධරයන් සහ සේවකයන් කාර්යාංශය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලබන නිලධරයන්ට සහ සේවකයන්ට කාර්යාංශය විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් සහ අනුපාතිකයන් මත පාරිශ්‍රමික ගෙවිය යුතු අතර, ඔවුන් කාර්යාංශය විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) කාර්යාංශයේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, කාර්යාංශය විසින් ඒ සමග කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන කාලයකට කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(4) රජයේ සේවයේ යම් නිලධරයකු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රජයේ සේවයේ යම් නිලධරයකු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නියමිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වූ යම් තැනැත්තකු කාර්යාංශය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් කාර්යාංශයට සේවය කරන කාලය ගිවිසුමෙහි බැඳීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට සේවය කරන ලද කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) කාර්යාංශයේ ඉල්ලීම පිට අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක හෝ සංවිධිත සභාවක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ පළාත් පාලන ආයතනයේ හෝ සංවිධිත සභාවේ කැමැත්ත ඇතිව, කාර්යාංශය විසින් එවැනි කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන

කාලයක් සඳහා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් කාර්යාංශය සහ අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවා උපදේශක සභාව හෝ ඒ පළාත් පාලන ආයතනය හෝ සංවර්ධන සභාව විසින් එකඟවන විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියමයන් සහ කොන්දේසි ඇතුළු යම් නියමයන් සහ කොන්දේසි මත, ඒ කාර්යාංශයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) කාර්යාංශයේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව එවැනිම කැමැත්ත ඇතිව කාර්යාංශය විසින් තීරණය කරනු ලබන යම් කාලයකට කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් කාර්යාංශය සහ ඒ රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් එකඟවන විශ්‍රාම වැටුප්වලට සහ අර්ථසාධක අරමුදල්වලට අදාළ නියමයන් සහ කොන්දේසි ඇතුළු යම් නියමයන් සහ කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(9) (7) වන උපවගන්තිය හෝ (8) වන උපවගන්තිය අනුව කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට යම් තැනැත්තකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයටම යටත් විය යුතු ය.

## X වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

60. (1) කාර්යාංශය විසින් සත්කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ කාර්යාංශයේ යම් නිලධරයකු විසින්— ඇතුල්වීමේ, පරීක්ෂා කිරීමේ සහ ප්‍රශ්න කිරීමේ බලතල

(අ) මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද යම් නියෝග අනුව ක්‍රියා කරනු ලබන්නේ දැයි දැනගැනීමේ කාර්යය සඳහා විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාර පවත්වනු කරගෙන යනු ලබන ස්ථානයකට, දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ යම් යුක්ති සහගත වේලාවක දී ඇතුළු වී එය පරීක්ෂා කිරීමට;

(ආ) මේ පනතින් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයකින් හෝ ඒ යටතේ හෝ ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් තබාගත යුතු යයි නියම කර ඇති යම් වාර්තා පරීක්ෂා කිරීම සහ ඒවායේ පිටපත් ගැනීම; සහ

(ඇ) ඒ ස්ථානයේ සිටින යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම

කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ දී ඒ නිලධරයාට බාධා කරන හෝ ප්‍රතිරෝධය පාන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් වරදකරු වන

අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළසකට නො අඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් විය යුතු ය.

නියෝග.

61. (1) නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇත්තා වූ හෝ නියම කළ යුතු යයි මේ පනතින් නියමිතව අවශ්‍ය වූ කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි තරම් ඉක්මනින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනුමත නොකිරීමේ දින සිට, ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක්, එසේ පරිච්ඡින්න කරන ලැබූ සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු ය.

බලය නොමැතිව රැකියා සැපයීම වරදක් බව.

62. (1) මේ පනතේ විධිවිධානවලට අනුකූලව හැර—

(අ) සේවානියුක්ති කාර්ය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටකිරීමට හෝ පිටත්ව යාමට යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකුට සහාය දීමට අදහස් කෙරෙන යම් කිසිවකින් යම් තැනැත්තකු සමග ගිවිසුම් ඇති කර ගන්නා හෝ ඇති කර ගැනීමට උත්සාහ කරන තැනැත්තකු ඒ තැනැත්තාගෙන් යම් මුදලක් ඉල්ලා සිටින හෝ භාර ගන්නා වූ;

(ආ) යම් තැනැත්තකුට සේවානියුක්ති කාර්ය සඳහා ශ්‍රී ලංකාවෙන් විගමනය කිරීමට හෝ පිටත්ව යාමට තැනැත්තෝ විගමනය කිරීමට හෝ පිටත්ව යාමට උත්සාහ කිරීමට ආධාර කරන හෝ විගමනය කිරීම පිණිස හෝ පිටත්ව යාම පිණිස යම් ස්ථානයකින් ඉවතට යාමට සලස්වන හෝ ආධාර කරන හෝ සැලැස්වීමට හෝ ආධාර කිරීමට උත්සාහ කරන

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළසකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ ඒ කාර්යය සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් නොමැතිව, විදේශ සේවා නියුක්ති නියෝජිතායතනයක ව්‍යාපාරය කරගෙන යන සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට ද වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද නොකඩවා කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් දෙසියයක අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

(3) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව මිස, මේ වගන්තිය යටතේ කිසිදු නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

[illegible] කිරීම සහ පෙළඹවීම වරදක් වේ.

63. (අ) සේවා නියුක්ති කාර්යය සඳහා යම් තැනැත්තකුගේ විගමනයට අවශ්‍ය හෝ අදාළ යම් ලේඛනයක් තුළ ව්‍යාජ සටහන් කරන්නා වූ හෝ වෙනස් කරන්නා වූ හෝ ඒ තුළ ලිපි තැබීමේ හෝ වෙනස් කිරීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන යම් උපකරණයක් හෝ දෙයක් තමාගේ සන්තකයෙහි හෝ පාලනය යටතේ තබා ගන්නා වූ; හෝ

(ආ) බස් කිරීමෙන්, බලකිරීමෙන්, වංචා කිරීමෙන් හෝ සිතාමතා වැරදි කරුණු ප්‍රකාශ කිරීමෙන් යම් තැනැත්තකු විගමනය කිරීමට හෝ විගමනය කිරීම පිණිස යම් ගිවිසුමකට ඇතුළු වීමට හෝ සේවා නියුක්ති කාර්යය සඳහා විගමනය කිරීමේ අරමුණ ඇතිව යම් ස්ථානයකින් පිටත්ව යාමට මෙහෙය වන්නා වූ හෝ පොළඹවන්නා වූ හෝ මෙහෙයවීමට හෝ පෙළඹවීමට උත්සාහ කරන්නා වූ

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට සහ මාස දෙළහකට නොඅඩු සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙකාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට ද යටත් විය යුතු ය.

ගාස්තු අය කිරීම වරදක් වේ.

64. (අ) යම් තැනැත්තකු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සැලසීමේ හෝ ලබා දීමේ කාර්ය සඳහා 54 වන වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි හැර අන්‍යාකාරයකින් යම් ගාස්තුවක් අයකරන බලපත්‍රලාභියකු වන යම් තැනැත්තකු;

(ආ) යම් තැනැත්තකු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සැලසීමේ හෝ ලබා දීමේ කාර්ය සඳහා තමා හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් මුදලක් ඉල්ලන හෝ භාරගන්නා හෝ භාර ගැනීමට උත්සාහ කරන බලපත්‍රලාභියකු නොවන යම් තැනැත්තකු

මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු

කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් එක් දහස් පන්සියයක නොඉක්මවන දඩයකට සහ මාස දොළහකට නොඅඩු සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් විය යුතු ය. ඊට අතිරේකව වරදෙහි විෂයය කාරණය වන යම් ගාස්තුවක් හෝ මුදලක් වරදකරු විසින් භාරගනු ලැබුවේ යම් තැනැත්තකු කෙරෙන් ද ඒ තැනැත්තාට ඒ ගාස්තුව හෝ මුදල ආපසු ගෙවීමට ද මහේස්ත්‍රාත්වරයා විසින් වරදකරුට ආඥාවක් කළ යුතු ය.

සාවද්‍ය ආදියට අදාළ වැරදි.

64. (අ) මේ පනත යටතේ සැපයීමට යම් තැනැත්තකුට නියම කරන ලද යම් වාර්තාවක් තොරතුරක් හෝ ප්‍රකාශයක් සැපයීම පැහැර හරින හෝ තමාගේ දැනීම අනුව අසත්‍ය සහ සාවද්‍ය යම් විස්තර ඇතුළත් යම් වාර්තාවක් ලිඛිත තොරතුරක් හෝ ලිඛිත ප්‍රකාශයක් සපයන;

(ආ) මේ පනත යටතේ පවත්වනු ලබන යම් පරීක්ෂණයක දී තමාගේ දැනීම අනුව අසත්‍ය හෝ සාවද්‍ය වූ යම් සාක්ෂියක් දෙන ; හෝ

(ඇ) 44 වන වගන්තිය යටතේ කරන ලද යම් ඉල්ලීමකට නියමයක් අනුව කටයුතු කිරීම පැහැර හරින

යම් තැනැත්තකු, මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට සහ මාස දොළහකට නොඅඩු සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ යටත් විය යුතු ය.

පරීක්ෂණවලට අදාළ වැරදි.

65. (අ) 44 (2) (අ) වගන්තිය යටතේ නියම කරනු ලැබූ විට යුක්ති සහගත හේතුවක් නොමැතිව පරීක්ෂණයක දී පැමිණ සිටීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන;

(ආ) ඒ ඡේදය යටතේ ප්‍රශ්න කරනු ලැබූ විට උත්තර දීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන;

(ඇ) 44 (2) (ආ) වගන්තිය යටතේ ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබූ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන;

(ඈ) 44 (2) (ඇ) වගන්තිය යටතේ නියම කරනු ලැබූ විට සත්‍ය දීම පිණිස දිවුරුම් දීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන

යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට සහ මාස දොළහකට නොඅඩු සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ යටත් විය යුතු ය.

67. (අ) 35 වන වගන්තියේ හෝ 36 වන වගන්තියේ හෝ 40(1) වන වගන්තියේ හෝ 41 වන වගන්තියේ හෝ 53 වන වගන්තියේ විධිවිධාන; හෝ — සමහර වැරදි

(ආ) 42 වන වගන්තියෙන් හෝ 43 වන වගන්තියෙන් හෝ 52 වන වගන්තියෙන් හෝ ඒ යටතේ තමාට කරන ලද යම් නියමයක්

අනුව කටයුතු කිරීම පැහැර හරින සෑම බලපත්‍රලාභියකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් එක් දහස් පන්සිය යක් නො ඉක්මවන දඩයකට සහ මාස දොළහකට නොඅඩු සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට මතු යටත් විය යුතු ය.

68. 63 වන වගන්තිය හෝ 64 වන වගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු ඒ වගන්තියක් යටතේ ම වරදකට තදනන්තරව වරදකරු කරනු ලැබූ විට, දෙවන හෝ තදනන්තර වැරදි සඳහා වරදකරු කරනු ලැබීම මත ඒ වගන්තියෙන් ඒ වරද සඳහා විධිවිධාන සලස්වනු ලැබූ දඬුවම මෙන් දෙගුණයක දඬුවමකට මතු යටත් විය යුතු ය. — 63 වන හෝ 64 වන වගන්තිය යටතේ තදනන්තර වැරදි සඳහා දඬුවම.

69. මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන අවස්ථාවක— — පුද්ගල මණ්ඩලයන් විසින් කරනු ලබන වැරදි.

(අ) පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු වූ සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවන වෙනත් මණ්ඩලයක් නම් වරද කරනු ලැබූ අවස්ථාවේ දී මණ්ඩලයේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුම

වරදකට වරදකරු විය යුතු ය:

එසේ වුව ද වරද කරනු ලැබුවේ තමාගේ දැනීම නොමැතිව බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට තමා සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කළහොත් ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ සාමාජිකයා ඒ වරදට වරදකරු ලෙස නොසැලකිය යුතු ය.

70. 1980 අංක 32 දරන විදේශ සේවා නියුක්ති නියෝජිතායතන පනත මේ පනතින් අවලංගු කරනු ලැබුව ද, 1980 අංක 32 දරන පනතේ 6 වන වගන්තිය යටතේ බලපත්‍රලාභියකු විසින් කම්කරු කොමසාරිස්වරයා සමග ඇතුළත් වූ සියලු ගිවිසුම් සහ බැඳුම්කර ඒ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවසන් වන තෙක් වලංගු සහ බලසහිත විය යුතු ය. තව ද, කම්කරු කොමසාරිස්වරයා වෙනුවට කාර්යාංශය එහි නම් කරනු ලැබුවාක් මෙන් හෝ ඊට පාර්ශ්වයක් කරනු ලැබුවාක් මෙන් සම්පූර්ණයෙන් සහ බලසහිතව ක්‍රියාත්මක කළ හැකි විය යුතු ය. — අන්තර්කාලීන විධිවිධාන

1980 අංක 32 දරන පනත ඉවත් කිරීම.

71. 1980 අංක 32 දරන විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතන පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

අර්ථ නිරූපණය.

72. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාරය" යන්නෙන් තැනැත්තන්ට ශ්‍රී ලංකාවෙන් පිටත සේවායෝජකයන් වෙත සේවානියුක්තිය ලබාදීමේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සේවායෝජකයන්ට ශ්‍රී ලාංකික ශ්‍රමය සැපයීමේ කාර්යය සඳහා (කොන්ත්‍රාත් සැපයීමෙන් වුව ද අන්‍ය ආකාරයකින් වුව ද) සේවා සැලසීමේ (ගාස්තු අයකිරීමෙන් හෝ අන්‍යාකාරයෙන් කරගෙන යනු ලැබුව ද නැත ද, වෙනත් යම් ව්‍යාපාරයක් සමග සම්බන්ධ කොට පැවැත්වුව ද නැත ද) ව්‍යාපාරය අදහස් වන අතර, ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා තැනැත්තන්ගෙන් ඉල්ලුම්පත් කැඳවන ප්‍රචාරක දැන්වීම් හෝ නිවේදනයක් නිකුත් කිරීම හෝ ඒ සේවානියුක්තිය හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වෙනත් යම් ක්‍රියාවක් කිරීම ඊට ඇතුළත් වේ;

"සභාපතිවරයා" යන්නෙන් මණ්ඩලයේ සභාපතිවරයා අදහස් වේ;

"සේවායෝජකයා" යන්නට සේවායෝජක මණ්ඩලයක් ඇතුළත් වේ;

"බලපත්‍රය" යන්නෙන් මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අදහස් වේ;

"බලපත්‍රලාභියා" යන්නෙන් විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාරය කරගෙන යාමට මේ පනත යටතේ බලපත්‍ර දෙනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් පනත හැර වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"පෞද්ගලික අංශයේ ව්‍යවසාය" යන්නෙන් සේවායෝජකයකු විසින් පෞද්ගලික අංශයෙහි කරගෙන යනු ලබන යම් ව්‍යවසායක් අදහස් වන අතර, ස්වයං සේවානියුක්ත තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යවසායක් ඊට ඇතුළත් වේ.

ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1994 අංක 4 දරන

# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත

---

[ගැසට් පත්‍රයේ පළ කළේ 1994 පෙබරවාරි මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1994 මාර්තු මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : 1.00 යි.

**1994 අංක 4 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත**

**[සහතිකය සටහන් කළේ 1994 පෙබරවාරි මස 28 වන දින]**

**එල්. ඩී.—ඕ. 14/93**

**1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1994 අංක 4 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 42 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙමගින් සංශෝධනය කරනු ලැබේ:— **1985 අංක 21 දරන පනතේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(ඇ) බලපත්‍රලාභියා විසින් පවත්වා ගෙන යනු ලබන විදේශ සේවා නියුක්ති නියෝජිතායතනයේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් කාර්යාංශයට අවශ්‍ය විය හැකි ලේඛන.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙමගින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.**

'(5) මේ වගන්තියේ කාර්ය සඳහා, "බලපත්‍රලාභියා" යන්නට, මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ යම් තැනැත්තකුට විරුද්ධව මේ වගන්තිය යටතේ පැමිණිලි ලක් කරන ලද හෝ පරීක්ෂණයක් පවත්වනු ලබන හෝ නඩුවක් පවරන ලද හෝ නඩුවක් පවත්වා ගෙන යනු ලබන හෝ දිනයේ දී, ඒ බලපත්‍රය බලාත්මකව තිබුණේ වුව ද නොතිබුණේ වුව ද එවැනි තැනැත්තෙක් ඇතුළත් වේ.'.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙමගින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලබන සෑම තැනැත්තකු විසින් ම, එම සේවා නියුක්තිය අයත් වන ගණය සඳහා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් මුදලක් කාර්යාංශයට ගෙවනු ලැබිය යුතු ය. එකිනෙකට වෙනස් සේවා නියුක්ති ගණවලට අවශ්‍ය නිපුණත්වය හා වෙනත් අදාළ කරුණු සැලකිල්ලට ගෙන, ඒ ඒ සේවා නියුක්ති ගණ සම්බන්ධයෙන් වෙනස් මුදල් ප්‍රමාණයන් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.".

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) බලපත්‍රලාභියකු විසින් යම් තැනැත්තකු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සලසනු ලැබූ හෝ ලබා දී ඇති අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ඒ තැනැත්තා විසින් කාර්යාංශය වෙත ගෙවන ලද මුදලින්—

(අ) සියයට තුන්තාවකට සමාන මුදලක් ඒ බල පත්‍රලාභියාට ; සහ

(ආ) සියයට දහයකට සමාන මුදලක් 45 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සුබසාධක අරමුදලට,

කාර්යාංශය විසින් ගෙවිය යුතු අතර, ඉතිරි මුදල කාර්යාංශය වෙත තබා ගනු ලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් "සභාපති, ලේකම් සහ සාමාන්‍යාධිකාරී සහ සාමාජික යන් විසින් තමන් අතුරින් පත් කාර්ය සඳහා තෝරා පත් කර ගනු ලැබූ වෙනත් සාමාජිකයන් තිදෙනකුගෙන්" යන වචන වෙනුවට "සභාපති, උප සභාපති, ලේකම්, සභාපති ලේකම් සහ සාමාන්‍යාධිකාරී සහ සාමාජිකයන් විසින් තමන් අතුරින් පත් කාර්ය සඳහා තෝරා පත් කර ගනු ලැබූ වෙනත් සාමාජිකයන් සතර දෙනකුගෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ නව වගන්තිය ඇතුළත් කිරීම.

"කාර්යාංශය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු බව.

60අ. අල්ලස් පනතේ අර්ථානුකූලව හා එහි කාර්යය සඳහා කාර්යාංශය උපලේඛනගත ආයතන යක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතුය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් "රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පනස්දහස නොඉක්මවන දඩයකට ද වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද නොකඩව සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් දෙසියයක අතිරේක දඩයකට ද නිසු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "රුපියල් විසි දහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂ යක් නොඉක්මවන දඩයකට ද, වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද නොකඩව කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් එක් දහසක අතිරේක දඩයකට ද, නිසු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියේ (අ) ඡේදයේ සඳහන් "35 වන වගන්තියේ හෝ 36 වන වගන්තියේ හෝ 40(1) වන වගන්තියේ හෝ 41 වන වගන්තියේ හෝ 53 වන වගන්තියේ විධිවිධාන ;" යන වචන සහ ඉලක්කම් වෙනුවට "35 වන වගන්තියේ හෝ 36 වන වගන්තියේ හෝ 37 වන වගන්තියේ හෝ 40(1) වන වගන්තියේ හෝ 40(2) වන වගන්තියේ හෝ 41 වන වගන්තියේ හෝ 53 වන වගන්තියේ විධිවිධාන ;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

" සාමාන්‍ය දණ්ඩනය.

67අ. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද හෝ දෙන ලද යම් නියෝගයක්, විධානයක් හෝ නියම කිරීමක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් මගින් නිශ්චිත දඬුවමක් ප්‍රකාශිතව ම නියම කර නොමැති මේ පනත යටතේ වූ යම් වරදකට වරදකරු වන යම් තැනැත්තකු, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොඅඩු සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාරය" යන්නෙහි අර්ථ කථනයේ "තැනැත්තන්ට ශ්‍රී ලංකාවෙන් පිටත සේවායෝජකයන් වෙත සේවා නියුක්තිය ලබා දීමේ" යන වචන වෙනුවට "තැනැත්තන්ට ශ්‍රී ලංකාවෙන් පිටත සේවායෝජකයන් වෙත (ආධුනිකත්වය සහ පුහුණුව ඇතුළුව) සේවා නියුක්තිය ලබා දීමේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "පෞද්ගලික අංශයේ ව්‍යාපාරය" යන්නෙහි අර්ථ කථනයේ "ස්වයං සේවා නියුක්ත තැනැත්තකු විසින් කරගෙන යනු ලබන" යන වචන වෙනුවට "පුද්ගලයකු විසින් කර ගෙන යනු ලබන" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 2009 අංක 56 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 01 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2009 ඔක්තෝබර් මස 02 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 6.50 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2009 අංක 56 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 01 වන දින]

එල්.ඩී.—ඕ. 11/2008.

**1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2009 අංක 56 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1985 අංක 21 දරන පනතේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතේ 16 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එහි (එ) ඡේදයේ "තෝරාගනු ලබන ආයෝජනවල ආයෝජනය කිරීමට" යන වචන වෙනුවට "තෝරා ගනු ලබන ආයෝජනවල ආයෝජනය කිරීමට," යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (එ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:—

"(ඒ) සේවා නියුක්තිය සඳහා එතෙර යන යම් තැනැත්තකු පනත යටතේ නියමිත ලියාපදිංචිය ලබා නොගෙන එතෙර යන බවට විශ්වාස කිරීමට නිලධරයන්ට හේතු ඇති අවස්ථාවක, පනතට අනුකූලව ලියාපදිංචිය ලබා ගෙන ඇද්ද යන කරුණ නිශ්චය කිරීමේ කාර්යය සඳහා ගොඩබිමින යම් ගුවන් තොටුපලක දී හෝ වරායක දී සේවා නියුක්තිය සඳහා එතෙර යන තැනැත්තකුගේ සන්තකයේ ඇති යම් ලේඛනයක් පරීක්ෂා කිරීම සඳහා කාර්යාංශයේ නිලධරයන්ට බලය පැවරීම ; සහ

(ඔ) ශ්‍රී ලංකා සේවා නියුක්තයන්ගේ සුභ සාධනය සඳහා එතෙර සිටින සේවා යෝජකයන්ගෙන් සමාජ ආරක්ෂණ බදු ලබා ගැනීම.".

2—PL 004359—3,490 (2009/09)

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(ආ) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) ඉල්ලුම්කරු විසින් බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවේ දී, මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දැනටමත් දරන්නේ නම්, මේ පනතේ විධිවිධාන ප්‍රකාරව කිසිදු බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 37අ වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම ප්‍රඥප්තියේ 37අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"අනුමැතියක් නොමැතිව වෙළෙඳ දැන්වීම් ආදිය පළ කිරීම තහනම් කිරීම.

37අ. (1) යම් වෙළෙඳ දැන්වීමක් හෝ දැන්වීමක් පළ කිරීම කාර්යාංශය විසින් 37 වන වගන්තිය යටතේ අනුමත කර ඇති බවට තමන් සෑහීමට පත් නොවී, ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස තැනැත්තන්ගෙන් ඉල්ලමින් බලපත්‍රලාභියකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද වෙළෙඳ දැන්වීමක් හෝ දැන්වීමක් කිසිම තැනැත්තකු විසින් යම් මාධ්‍යයක මුද්‍රණය කිරීම හෝ පළ කිරීම නැතහොත් මුද්‍රණය කිරීමට හෝ පළ කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "බඳවාගනු ලබන" යන වචන වෙනුවට "පිටව" යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "බඳවාගනු ලබන" යන වචන වෙනුවට "පිටව" යන වචනය ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 51අ වගන්තිය ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රඥප්තියේ 51අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"කොමිස් මුදල් හා වෙනත් ගෙවීම් අය කිරීම.

51අ. (1) ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා ලබා ගැනීම සඳහා යම් බලපත්‍රලාභියකු විසින් යම් කොමිස් මුදලක් හෝ වෙනත් ගෙවීමක් නොලබන අවස්ථාවක, බඳවාගනු ලබන තැනැත්තාගෙන් ලියාපදිංචි වීමේ ගාස්තුව ලබා ගැනීමට අමතරව, කාර්යාංශයේ පූර්ව අනුමැතිය ලබාගෙන ඔහු විසින් දැරීමට සිදුවන සත්‍ය වියදම් අය කරගනු ලැබිය හැකි ය. ඉල්ලා ඇති වියදම් අසාධාරණ බවට කාර්යාංශයේ විශ්වාසය වන අවස්ථාවක කාර්යාංශය විසින් 37 වන වගන්තිය යටතේ අනුමැතිය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(2) යම් බලපත්‍රලාභියකුට එකී සේවා යෝජකයකුගෙන් වියදම් සඳහා ගෙවීම් ලැබී තිබිය දී ඒ ගෙවීම් ලැබුණ බව සඟවමින් ඒ වියදම් ගෙවන ලෙස ඉල්ලා සිටින අවස්ථාවක, ඒ බලපත්‍රලාභියා මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභියකුට කාර්යාංශය විසින් අනුමත කරන ලද ගෙවීමක් ලැබුණ අවස්ථාවක, එසේ ලැබුණ මුදල සඳහා බලපත්‍රලාභියා විසින් ලදුපතක් නිකුත් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය ප්‍රකාරව ලදුපතක් නිකුත් නොකරන බලපත්‍රලාභියකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(5) කාර්යාංශයේ මතය අනුව, බලපත්‍රලාභියකු විසින් (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන වාර්තාවල

කොමිස් මුදල වශයෙන් ලැබුණ බවට හෙළිකර ඇති මුදල සාධාරණ නොවන සහ කොමිස් මුදල වශයෙන් ලැබිය යුතු මුදලට වඩා අඩු මුදලක් වන අවස්ථාවක, (4) වන උපවගන්තිය යටතේ තක්සේරු කිරීමේ කාර්යය සඳහා කොමිස් මුදල විය යුත්තේ සේවා නියුක්තියේ ස්වභාවය සහ අනුයෝජිතයන්ට ලැබිය හැකි ප්‍රතිලාභවල ප්‍රමාණය සලකා බලා අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මුදල වන්නේ ය.

(6) (3) වන උපවගන්තිය යටතේ සෙස් බද්ද ගෙවීම බලපත්‍රලාභියකු විසින් පැහැර හරින අවස්ථාවක හෝ සෙස් බද්දට අදාළව (4) වන උපවගන්තිය යටතේ කාර්යාංශය විසින් බලපත්‍රලාභියාට අදාළව තක්සේරුවක් කරනු ලබන අවස්ථාවක, කොමිස් මුදල් ප්‍රමාණය, ලැබිය යුතු කොමිස් මුදලට වඩා අඩුවන විටෙක බලපත්‍රලාභියා වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු දඩයකට ඔහු යටත් විය යුතු ය. මහෙස්ත්‍රාත්වරයා විසින්, ඊට අමතරව, පැහැර හැර ඇති සෙස් බදු ප්‍රමාණය ගෙවන ලෙස ද එම බලපත්‍රලාභියාට නියම කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (3) වන උපවගන්තියේ ඇති "සෑම බලපත්‍රලාභියකු ම සංගමයේ සාමාජිකයකු විය යුතු ය." යන වචන වෙනුවට "යම් බලපත්‍රලාභියකුට සංගමයේ සාමාජිකයකු විය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "නියම කර ඇති යම් වාර්තා පරීක්ෂා කිරීම සහ ඒවායේ පිටපත් ගැනීම" යන වචන වෙනුවට "නියම කර ඇති, විදේශ නියුක්තියට අදාළ යම් ලේඛන සහ වාර්තා පරීක්ෂා කිරීම සහ ඒවා ගැනීම" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 60ආ, 60ඇ සහ 60ඈ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 60ආ, 60ඇ සහ 60ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

"කාර්යාංශයේ නිලධරයන් හා සේවකයන් අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ කාර්යය සඳහා රජයේ නිලධරයන් අදී වශයෙන් සලකනු ලැබිය යුතු බව.

60ආ. කාර්යාංශයේ සෑම නිලධරයකු සහ සේවකයකු 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා—

(අ) රජයේ නිලධරයකු ; සහ

(ආ) සාම නිලධරයකු ලෙස,

සලකනු ලැබිය යුතු ය.

කාර්යාංශයේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

60ඇ. කාර්යාංශයේ සෑම නිලධරයකු සහ සේවකයකු ම (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩු පැවරීමෙන් මුක්තිය.

60ඈ. (1) (අ) මේ පනත යටතේ කාර්යාංශය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සඳහා කාර්යාංශයට එරෙහිව; හෝ

(ආ) මේ පනත යටතේ හෝ කාර්යාංශයේ විධානය මත කාර්යාංශයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සඳහා කාර්යාංශයේ එවැනි යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට එරෙහිව,

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරිපිට දී කාර්යාංශය විසින් හෝ එයට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කාර්යාංශයට උපචිත වූ යම් වියදම් කාර්යාංශයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කාර්යාංශය වෙත ගෙවන ලද හෝ කාර්යාංශය විසින් අය කර ගන්නා ලද යම් ගාස්තුවක් කාර්යාංශයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් එක් දහසකට නොවැඩි" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයකට නොඅඩු දඩයකට සහ අවුරුදු හතරකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් විසි දහසකට නොඅඩු" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයකට නොඅඩු දඩයකට සහ අවුරුදු හතරකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ "රුපියල් එක් දහසකට නොඅඩු" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන වෙනුවට "රුපියල් විසිපන් දහසකට නොඅඩු දඩයකට සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියේ "රුපියල් එක් දහසකට නොඅඩු" යන වචනවල සිට "යටත් විය යුතු ය" යන්න දක්වා වූ වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් පනස් දහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට සහ අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තියේ "රුපියල් එක් දහසකට නොඅඩු" සහ "රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් පන් දහසකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ "රුපියල් එක් දහසකට නොඅඩු" සහ "රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් පන් දහසකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියේ "රුපියල් එක් දහසකට නොඅඩු" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් විසිපන් දහසකට නොඅඩු හා රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් එක් දහසක්" යන වචන වෙනුවට "රුපියල් විසිපන් දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 67ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 67ආ වගන්තිය ඇතුළත් කිරීම.

"වන්දියක ආධාර හා අනුග්‍රහ දීම.

67ආ. මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කිරීමෙහි ලා බලපත්‍රලාභියකුට හෝ ඔහුගේ

සේවානියුක්තයකුට ආධාර කරන හෝ අනුබල දෙන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන් දහස නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට, 69අ සහ 69ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 69අ සහ 69ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

“සිරභාරයට ගැනීමේ බලතල.

69අ. 37අ, 62, 63 හෝ 64 යන වගන්ති යටතේ යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අවස්ථාවක හෝ එවැනි වරදක් සිදු කිරීමෙහි ලා යම් තැනැත්තකු වරදකරු බවට සාධාරණ සැකයක් පවතින අවස්ථාවක එම තැනැත්තා ගොඩබිම හෝ ජලය මත යම් ස්ථානයක දී යම් පොලිස් නිලධරයකු විසින් හෝ තත් කාර්යය සඳහා කාර්යාංශය විසින් බලය පවරන ලද කාර්යාංශයේ සේවානියුක්තයකු විසින් එම තැනැත්තා වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබිය හැකි අතර, එසේ සිරභාරයට ගනු ලැබූ සෑම තැනැත්තෙක් ම—

(i) නීතිය අනුව ක්‍රියා කිරීම සඳහා වහාම මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; හෝ

(ii) එසේ කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවක, නීතිය අනුව ක්‍රියා කිරීම සඳහා වහාම ළඟම ඇති පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත භාර දිය යුතු ය.

දඩ මුදල් වලින් යම් කොටසක් කාර්යාංශයේ කම්කරුවන්ගේ සුභ සාධක අරමුදලට ගෙවිය යුතු බව.

69ආ. (1) මේ පනතේ යම් විධිවිධානයක් යටතේ වූ යම් වරදක් සඳහා යම් තැනැත්තකු වරදකරු කරනු ලැබ යම් දඩ මුදලක් පනවනු ලැබූ අවස්ථාවක, එසේ පනවා අයකර ගනු ලැබූ දඩ මුදලින් සියයට හැත්තෑ පහක් පනතේ 45 වන වගන්තිය යටතේ පිහිටුවන

ලද කාර්යාංශයේ සාමාජිකයන්ගේ සුභසාධන අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ යම් විධිවිධානයක් යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් ලඝු නඩු විභාගයක් පවත්වන මහෙස්ත්‍රාත්වරයකු විසින් දණ්ඩන නියමයට අමතරව, පනවා අයකරගනු ලබන දඩ මුදලින් සියයට හැත්තෑ පහක් කාර්යාංශයේ සාමාජිකයන්ගේ සුභ සාධන අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු බවට ආඥා කරනු ලැබිය යුතු ය.".

**20.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.